# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2458/47- 2025 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2025.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. - බී. 6/2025

1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනත

7 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනතේ 7 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියමය.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2025 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

1969 ඔක්තෝබර් මස 5 වන දින අංක 14, 874/4 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. ඒ නියමයේ 2 වන ඡේදයේ -

(1) ඒ ඡේදයේ (2) වන අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් -

"(2) ඡන්ද විමසීමක දී ඡන්දය ලබාදීම අතින් ඡන්දය සලකුණු කිරීමෙන්, ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මඟින් හෝ අතථ්‍ය ව සිදුවිය යුතු ය. ඡන්ද විමසීමක් ඒ කුමන ආකාරයෙන් පවත්වනු ලැබුවද එමගින් එම ඡන්ද විමසීම අවලංගු වීමක් හෝ එහි වලංගුභාවයට බලපෑමක් ඇති නොවිය යුතු ය.";

(2) ඒ ඡේදයේ (2) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන් :-

"(3) එක් එක් ඡන්ද විමසීම සඳහා භාවිත කරනු ලැබිය යුතු ඡන්දය ලබාදීමේ ක්‍රමය සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එය සභාව විසින් ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව වූ දින තිහකට වඩා අඩු නොවන කාලයක් තුළ ඡන්ද විමසීමට අදාළ තොරතුරු සහ අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය සමඟ ආයතනයේ සියලු සාමාජිකයන් වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. පනතේ විධිවිධාන යටතේ නුසුදුස්සකු බවට පත් වන්නේ නම් මිස, ආයතනයේ සෑම සාමාජිකයකුට ම, ඡන්ද විමසීමේ දී ඡන්දය ලබාදීම සඳහා හිමිකමක් ඇත්තේ ය.

(4) පනතේ විධිවිධානවලට යටත් ව, මේ නියමයේ සඳහන් කිසිවක් මඟින් තත්කාලයේ දී ශ්‍රී ලංකාවේ වාසය කරනු නොලබන ආයතනයේ යම් සාමාජිකයකු ඡන්ද විමසීමේ දී ඡන්දය ලබාදීමෙන් හෝ ඡන්ද විමසීමේ දී ඒ සඳහා තරඟ කිරීමෙන් හෝ වළක්වනු ලැබ ඇති ලෙසට කියවා තේරුම් නොගත යුතු ය.".

2. ඒ නියමයේ 6 වන ඡේදයේ (5) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(6) අතථ්‍ය ලෙස ඡන්දය ලබාදීමේ දී, අපේක්ෂකයන්ගේ නාම ලේඛනය ආරක්ෂිත අතථ්‍ය ලෙස ඡන්දය දීමේ ක්‍රමය මඟින් ඡන්දදායකයාට ලැබීමට සැලැස්විය යුතු අතර ඡන්දදායකයා විසින් එම ඡන්දය දීමේ ක්‍රමය මඟින් තම මනාපය ලබා දෙන අපේක්ෂකයා තෝරාගනු ලැබිය හැකි ය.".

3. ඒ නියමයේ 10 වන ඡේදයේ -

(1) ඒ ඡේදයේ (7) (අ) අනුඡේදයේ "ක්‍රියාකරුවන් විසින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සිදු කළ යුතු ය;" යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"ක්‍රියාකරුවන් විසින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සිදු කළ යුතු ය:

එසේ වුවද, ආයතනය විසින් ඡන්දදායකයා වෙත ලබාදෙන පූර්ව ලිඛිත උපදෙස්වලට අනුකූලව ඡන්දදායකයා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, නම් කරන ලද අතථ්‍ය ලෙස ඡන්දය ලබාදීමේ ක්‍රමය තුළින් ඡන්දදායකයකු අතථ්‍ය ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකිය.";

(2) ඒ ඡේදයේ (7) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(8) අතථ්‍ය ලෙස ඡන්දය ලබා දෙන අවස්ථාවක දී -

(අ) ඡන්දය ලබා දීම සඳහා සුදුසුකම් ලබන සෑම සාමාජිකයකු වෙත ම ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික ඡන්දය ලබාදීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) අවශ්‍ය අවස්ථාවක දී ද්විත්ව - සාධක සහතික කිරීම ඇතුළු උචිත ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රම භාවිත කිරීම මඟින් එක් එක් ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගනු ලැබිය යුතු ය;

(ඇ) නිවැරදිභාවය, රහස්‍යභාවය සහ සත්‍යවත්භාවය සහතික කරනු ලබන ආකාරයකින් ඡන්ද වාර්තාගත කිරීම, කේතගත කිරීම සහ ගබඩා කිරීම කරනු ලැබිය යුතු ය;

(ඇ) මාර්ගත ලෙස ඡන්දය ලබාදීමේ ක්‍රමය ඡන්දදායකයා වෙත පැය තුනකට වඩා අඩු නොවන කාලයක් සඳහා ලබා දිය යුතු අතර එම කාලය තුළ ඡන්දදායකයාට ඒ සඳහා ප්‍රවේශ විය හැකි විය යුතු ය;

(ඉ) මාර්ගගත ලෙස ඡන්දය ලබාදීම සඳහා ආයතනයේ සාමාජිකයන් ආයතනය වෙත භෞතික වශයෙන් පැමිණීම අවශ්‍ය නොවිය යුතු අතර නම් කරන ලද අතථ්‍ය ලෙස ඡන්දය ලබා දීමේ ක්‍රමය හරහා දුරස්ථව සිටිමින් ඡන්දය ලබාදීම සඳහා අවසර ලබා දිය යුතු ය.”.

4. ඒ නියමයේ 13 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

“අතින් ඡන්දය සලකුණු කිරීම සහ ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මඟින් ඡන්දය ලබා දීම සඳහා වන අවශ්‍යතා අතථ්‍ය ලෙස ඡන්දය ලබා දීම සම්බන්ධයෙන් ද අදාළ විය යුතු බව.

**13අ.** ඡන්ද විමසීම් ක්‍රියාවලියේ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා, ආයතනය විසින් කලින් කලට නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව අතින් ඡන්දය සලකුණු කිරීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මඟින් ඡන්දය ලබාදීමට අදාළ වන සියලු අවශ්‍යතාවන්, අතථ්‍ය ලෙස ඡන්දය ලබාදීම සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.”.

5. ඒ නියමයේ 14 වන ඡේදයේ “ලේකම්වරයා” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

“ “අතථ්‍ය ලෙස ඡන්දය ලබාදීමේ ක්‍රමය”, යන්නෙන්, යම් ඡන්ද විමසීමක දී ඡන්ද මධ්‍යස්ථානයකට ඡන්දදායකයන් භෞතික වශයෙන් පැමිණීමේ අවශ්‍යතාවකින් තොරව ආරක්ෂිතව ඡන්දය ලබාදීම, වාර්තා කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ ඡන්ද ගණන් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධති, උපකරණ හෝ ඩිජිටල් ක්‍රම භාවිත කිරීම අදහස් වේ.”

EOG 10 - 0181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.